# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } ආර්ජී/එන්බී/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } .....2021.03.17


චක්‍රලේඛ 05/2021

සියලුම කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ

සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත,

<u>ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ බලය පැවරීම</u>

1902 අංක 04 දරන ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ඇටෝර්නි බලපත්‍ර අතරින්, ඇටෝර්නි බලකරුගේ පදිංචිය ඔබගේ බලප්‍රදේශය තුළට ගැනෙන ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ බලය ඔබ වෙත පවරා ඇත.

02. මෙම බලය පැවරීමට ඇතුලත් නොවන දේශීය හා විදේශීය ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමට සිදුවීම හේතුවෙන් සේවාලාභීන් දැඩි දුෂ්කරතාවයන්ට පත් වන බව පෙනේ.

03. ඒ අනුව 2021.03.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1902 අංක 04 දරන ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත අනුව ලියා සහතික කරන ලද සියලුම දේශීය හා විදේශීය ඇටෝර්නි බලපත්‍ර, ඇටෝර්නි බලකරුගේ පදිංචි ලිපිනය නොසලකා ඔබ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ බලය ඔබ වෙත පවරමි.

04. ඒ අනුව නියමිත දින සිට ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරන ලෙසත් ලියාපදිංචි කරනු ලබන කාර්යාලයේ සහ නිලධාරියාගේ විස්තර ඇමුණුම 01 ආකෘතියට අනුව පිටපත් දෙකකින් සකස් කර කඩිනමින් එවීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්
01. ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය -
02. ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය -
03. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් -
04. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් -
05. රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ සහ ස්වදේශ කටයුතු ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් -
} කාරුණික දැන ගැනීම සඳහා

06. සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය - ඔබගේ සාමාජිකත්වය දැනුවත් කිරීම සඳහා


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. } 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.rgd.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் } rgd@sltnet.lk, rg@rgd.gov.lk

ඇමුණුම 01

| | |
|---|---|
| ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කරන කාර්යාලයේ නම සහ ලිපිනය | |
| අත්සන් කරන නිලධාරියාගේ සම්පූර්ණ නම | |
| තනතුර | |
| ආදර්ශ අත්සන | |
| නිල මුද්‍රාවේ ආදර්ශය (සිංහල) | |
| නිල මුද්‍රාවේ ආදර්ශය (ඉංග්‍රීසි) | |